රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 24/95

මගේ අංකය: 1/543ඊ/02ඩී/14/94
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, වැවිලි
කර්මාන්ත හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07
1995 ජූලි මස 14 වැනි දින

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්.

**රාජ්‍ය සේවයේ, පළාත් රාජ්‍ය සේවයේ හා රාජ්‍ය සංස්ථා**
**අංශයේ කණිෂ්ඨ සේවක ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීම.**

අංක 30/93 හා 1993.12.16 දින දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය වෙත ඔබගේ අවධානය යොමු කරනු ලැබේ.

02. ඉහත සේවාවන්හි කණිෂ්ඨ සේවක ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවාගැනීමේ පරිපාටිය මතු දැක්වෙන පරිදි සංශෝධනය කිරීමට රජය තීරණය කොට ඇත.

03. කණිෂ්ඨ සේවක පුරප්පාඩු පිරවීමේදී අදාල අමාත්‍යාංශ ලේකම්/ආයතන ප්‍රධානීන් විසින් බඳවාගැනීම් කිරීමේ ක්‍රමය තවදුරටත් ක්‍රියාත්මක කෙරෙනු ඇත.

04. ඒකාබද්ධ කාර්යාල සේවක සේවයට අයත් පුරප්පාඩු පිරවීම සම්බන්ධයෙන් අමාත්‍යාංශ ලේකම්වරුන්/ආයතන ප්‍රධානීන් විසින් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂගේ පූර්ව අනුමැතිය ලබාගත යුතු අතර, පුරප්පාඩු පිරවීම අමාත්‍යාංශ ලේකම්වරුන්/ආයතන ප්‍රධානීන් විසින් සිදුකරනු ඇත. එම පත්වීම් සඳහා විධිමත් පත්වීම් ලිපිය නිකුත් කිරීම ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ විසින් කරනු ලබන අතර, සුදුසු අපේක්ෂකයන් තෝරා ගැනීමෙන් මසක කාලයක් ඇතුලත ඔවුන්ගේ අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් පිළිබඳ සහතික ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කොට විධිමත් පත්වීමේ ලිපි ලබාගැනීමට අමාත්‍යාංශ ලේකම්වරුන්/ආයතන ප්‍රධානීන් කටයුතු කලයුතුය.

05. මෙම කණිෂ්ඨ සේවක තනතුරු සඳහා අවම සුදුසුකම් පහත දැක්වෙන පරිදි වේ.

(අ) අධ්‍යාපන සුදුසුකම් - 8 වන පන්තිය සමත්වීම

(ආ) වයස - අවු: 18 - 45 අතර විය යුතුය.

(ඇ) දෙපාර්තමේන්තුගත තනතුරු සඳහා විශේෂ සුදුසුකම් අවශ්‍ය වන අවස්ථාවලදී තනතුරු සඳහා අනුමත බඳවාගැනීමේ පරිපාටිය අනුව මෙම අධ්‍යාපන සුදුසුකම් ඉහල දැමිය හැකිය.

02. මෙම තනතුරු සඳහා බඳවාගැනීම් කරනු ලබන්නේ පහත සඳහන් ආකාරයටය.

i. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

ii. ලකුණු දෙන ක්‍රමය තනතුරේ ස්වභාවය අනුව තීරණය කලහැකිය.

iii. 1992.03.24 දිනැති අංක: 17/92 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය මගින් අනුමත කරන ලද ත්‍රස්තවාදී විපත්වලට භාජනය වූ පවුල්වල සාමාජිකයන් වෙනුවෙන් ලබාදුන් සහන ලකුණු ක්‍රමය ද, 1993.12.16 දිනැති අංක 30/93 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය මගින් අනුමත කරන ලද අඩු ආදයම් ලබන පවුල්වල සාමාජිකයන් සඳහා දෙනු ලබන සහන ලකුණු ක්‍රමය ද මෙම සම්මුඛ පරීක්ෂණ වලදී උපයෝගී කර නොගතයුතුය.

07. ලකුණු වෙන්කරදීමේ ක්‍රමය අයදුම්පත් කැඳවනු ලබන අවස්ථාවේදීම ප්‍රකාශයට පත්කල යුතුය.

08. මෙම බඳවාගැනීම් 1990.03.09 දිනැති අංක: 15/90 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි සඳහන් ජනවර්ගික අනුපාතයට අනුකූල වියයුතුය. 1993.12.16 දිනැති අංක: 30/93 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය මෙයින් අවලංගු කෙරේ.

අ.කලේ/(**ආර්.එස්.ජයරත්න**)
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
වැවිලි කර්මාන්ත හා පාර්ලිමේන්තු
කටයුතු අමාත්‍යාංශය